

## ලියා දන්වන වග යි

### නත්තල්

ජේසු බිළින්දා උපත ලද නත්තල ආධ්‍යාත්මික ශාස්තෘවරයකුගේ උත්පත්තිය වෙනුවෙන් වෙන්කළ දිනයක් ය යන්න පසෙකට වී එය නත්තල් සීයාගේ දිනයක් බවට පත් කරන්නනට වාණිජ බලවේග සමත්ව තිබෙනු දකින විට කණගාටුවක් ඇති වෙයි. අද නත්තල ශුද්ධ වූ දිනයක් ය යන්න අමතක වී යන තරමට වාණිජ බල පරාක්‍රමය ඉස්මතු වී ඇත.

සියල්ල වාණිජකරණය වී ඇති ලෝකයක ජේසු බිළින්දා අබිබවා නත්තල් සීයා ඉස්මතුවී ඒම තේරුම් ගත හැකි ය. ජේසු බිළින්දාට වඩා ආකර්ශණීය ලෙස අලෙවි කළ හැක්කේ නත්තල් සීයාව ය. දරුවන් රැවටිය හැකි වන්නේත් ඒ රැවටුණ දරුවන් හරහා දෙමාපියන් ඩැහැගත හැකි වන්නේත් නත්තල් සීයා ඉදිරියට දැමීමෙනි.

දරුවන් රැවටෙන්නේ නොදන්නා කමට ය. දෙමාපියන් රැවටෙන්නේ මන්දැයි තේරුම් ගත හැකි වන්නේ කාට ද?

### වසරක් අවසන

වසරක අවසානය අත ළඟටම පැමිණ ඇත.

කාලය අසුරු සැණින් ගෙවී යමින් තිබේ. නිස්කලංකයක් නැති දිවි පැවැත්මක සිරකරුවන් බවට පත්ව ඇති මිනිසුන් ගේ ජීවිත ගෙවී යන වේගය කිසිදු කළකට වඩා වේගවත් බව දැන් දැනෙයි. සරළ නිදහස් නිස්කලංක දිවි පෙවෙත යනු අතීතයට පමණක් සීමා වූ සුරංගනා කතාවක් මෙන් අපේ මතකයේ රැඳී ඇත.

කිසිදු දිනෙක ගැළවීමක් නොලැබෙන මේ මහා ප්‍රවාහයට අසුව පහළට ගසාගෙන යන මිනිසුන් අතරින් මේ සත්‍යය වටහා ගත්තේ කීයෙන් කී දෙනෙක් ද?

### සුබ නව වසරක්

සන්නස පාඨක ඔබටත් අප හා අත්වැල් බැඳගත් ලිපි ලියන සිත්තම් කරන සැමටත් වෙළඳ දැන්වීම් සපයා දීමෙන් සහය දුන් ව්‍යාපාරික ආයතන වලටත් බෙදාහැරීමේ දී තම කාලය ශ්‍රමය කැප කරන හිතවතුන්ටත් නන් අයුරින් සහය දුන් සැමටත් සුබ නව වසරක් වේවා..!

## කවි කොළය

''පසුගිය ඡන්දයෙදි ලිබරල් මහ පුටුව
මට හිමි වුණා නම් අගමැති මමයි මමයි''
පීටර් කොස්ටෙලෝගේ මේ කතාවට
නායක ජොනී ඇවිදිනවලු කේන්තියෙන්

''අගමැති පුටුව අරගෙන දෙන්නට නුඹට
ඡන්දෙට ගෙහුං මට නැතිවිය සීට් එකත්
පස්වෙනි වතාවත් නැත්නම් මමයි රජා
නාඩං කොස්ටෙලෝ පෙර පිං නැතුවාට''

වෙත්තසිංහ






# උඳුවප් අසිරිය

ලස්සන සොබා දහමෙහි ඇති මිහිර විඳ
ගතකර දොළොස් මහ අප හැම සමග හිඳ
හිරු දෙව් තවත් ගමනක් නිම කරන සඳ
උඳුවප් මහේ සංගීතය ඇසෙනවද

කළුවර වලා මැද අහසෙහි පියකරුව
පායා නැගී හෙමිහිට පින්බර තරුව
හෙළිකළ බිළින්දෙකු සැතපෙන ගව ඔරුව
දිනයයි අලුත් ලෝකයකට මුල පිරුව

බැති ගීතිකා නිබඳව දෙසවනට ඇහේ
නත්තල් අසිරියෙන් මුළු මිහිතලය වැහේ
උඳුවප් සීත නළ රැ ල්ලක සුවය එහේ
සිසිලස ගෙනේවා ජීවිත වලට මෙහේ

සාමයෙ කුමරු පිළිබඳ තොරතුරු ඈත
යුග යුග බැඳී කළ එළි වන විට මෑත
අප හුරු පුරුදු රට නැති මුදු ළඟ පාත
හදවත සොයා යයි උඳුවප් මහ සීත

ජගත් වෙත්තසිංහ

## සන්නස
සෑම මාසයකම 15 වන දා නිකුත් වෙයි

සන්නස

**සංස්කරණය/Editor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සංස්කරණ සහය/Asst. Editors**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage
අසෝක සුබසිංහ Asoka Subasinghe

**තාක්ෂණ සහය**
දසුන් ගජමන් Dasun Gajaman

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ආචාර්ය විද්‍යානි මනතුංග
ශ්‍රියාණි මද්දුමගේ
චන්දි මාපා
මහින්ද දිසානායක දිවුල්ගනේ
ශ්‍රියා කුමාරසිංහ
මේනකා ජයතිලක

සේයා රූ
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

පිටු සැකසුම/ග්‍රැෆික් නිර්මාණ
ජගත් ජේ එදිරිසිංහ
Page Layout & Graphic Designs
Jagath J Edirisinghe

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku
02 9626 7660
02 9837 5055

**WA**
Kapila Hemantha Balage
08 9456 1972

**QLD**
Ananada Samaratunga
07 3372 7953

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**SA**
Chandta Eeriyagama

**TAS**
Anura Seneviratne
03 6327 4259

**Sannasa**
22 Lorne Street
Lalor Vic 3075 Australia

**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasa@gmail.com
Tel/Fax : 03 9402 5380

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

## සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය **ඉතා කෙටියෙන්** ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න.